ජනාධිපතිතුමනි, දෙමළ ජනයා ගැන ඔබ දැන ගත යුතු දෙයක් තිබේ. ඔවුනට සිය භාෂාව දෙවියන් වැන්න. සිය බසට ඒ සා කැපවීමක් ඇති සංස්කෘතීන් ලොව ඇත්තේ අතළොස්සකි.

ඔබ නීතිඥයකු ලෙස පුහුණුවක් ලැබූවෙකි. ඔබේ වෘත්තියේ මුල් කාලයේ දී ඔබ දෘඪතර මානව හිමිකම් ආරක්ෂකයකු විය. ජයග්‍රහණයන් ලබා රෝමයට ආ වීරයකු සේ ජුලියස් සීසර් මෙන් අද ඔබ ජනප්‍රිය ය. බලවත් ය. ඔබ ඉල්ලා සිටින කිසිවක්

*ඔබ එක් ප්‍රභාකරන් කෙනෙක් මරා දැමුවෙහි ය. එහෙත් තවත් ප්‍රභාකරන් කෙනෙක් ගොඩ නැගී ඒමට ඉඩ නොතබන්න. කඩු සහ තුවක්කු මගින් එවැන්නකු බිහි වීම වලක්වන්නට ඔබට බැරි ය. එය කළ හැක්කේ ඔබේ හදවතින් සහ ඥානයෙන් පමණි.*

ප්‍රතික්ෂේප කිරීමට තරම් කිසිවකු බලවත් නැත.

අප නීති විද්‍යාලයේ දී සෝල්බරි ව්‍යාවස්ථාව ඉගෙන ගත් අවස්ථාවේ දී හැදෑරූ වෙනස් කල නොහැකි විධිවිධාන සම්මත කරන්න. (entrenched provisions) යනුවෙන් හැඳින්වෙන වෙනස් කල නොහැකි විධිවිධාන යනු ශ්‍රී ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාවෙහි තිබූ 29 වන වගන්තිය යි. ඉන් කියැවුනේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට කිසිදු සුළුතර ජනප්‍රජාවට විශම සැලකීමක් කරන නීති සම්මත කල නොහැකි බව යි. මෙම 29 වන වගන්තිය කිසිම ලෙසකින් වෙනස් කල නොහැකි වගන්තියක් ලෙස ව්‍යවස්ථාවට එක් කර තිබුණි. 1972 ජනරජ ව්‍යවස්තාව සකස් කිරීමේ දී එම වගන්තිය සහමුලින්ම නොසළකා හරින ලදී - අවශ්‍ය නම් මගේ සහාය ඔබට හිමි ය. සාගින්නෙන් ද නිරුවතින් ද සිටින දෙමළජනයා ඔවුනට කියා ස්ථානයක් ඇත්දැයි ඔබ දෙස බලා සිටී. සහතික කරන්න, ඔවුනට තැනක් ඇති බව.

ඔබ එක් ප්‍රභාකරන් කෙනෙක් මරා දැමුවෙහි ය. එහෙත් තවත් ප්‍රභාකරන් කෙනෙක් ගොඩ නැගී ඒමට ඉඩ නොතබන්න. කඩු සහ තුවක්කු මගින් එවැන්නකු බිහි වීම වලක්වන්නට ඔබට බැරි ය. එය කළ හැක්කේ ඔබේ හදවතින් සහ ඥානයෙන් පමණි. කරුණාව, සත්‍යය සහ යුක්තිය. ඔබ ඒ බව බුදුන්ගෙන් ඉගෙන ගත්තෙහි ය. ඔබට අවශ්‍ය අවි ඒවා ම පමණි. අන් කිසිවක් නොවේ. ධම්මපදයට අනුව බුදුන් කීවේ වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බවත් එය ආදරයෙන් පමණක් සිදුවන බවත් ය.

ජනාධිපතිතුමනි, ඔබ මේ ලස්සන නගරයෙන් ආපසු යන විට මට පොරොන්දු වෙන්න හෙට දවසේ පාසැලට යන දස හැවිරිදි දරුවාගේ සුදු කමිසයෙහි ජම්බු රත මිස අන් රතු පැල්ලමක් නොතිබෙන බවට. උදෑසන කපුටා වරකා ගෙඩිය මිස වෙනත් දෙයක් නොහාරනු ඇති බවට. මා සුවඳ උරා බිව් අඹ ගසෙන් පලතුරු මිස අන් කිසිවක් නොඑල්ලෙනු ඇති බවට.

ගරු ජනාධිපතිතුමනි, අප යලි පාරාදීසයට කැඳවා යන්න. ඔව්, යලි පරාදීසයට කැඳවා යන්න.

■

සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net




# මගේ වෑයම අපේ ශිල්පීන් සමග ජාත්‍යන්තර තලයට යාමයි

## හර්ෂ පෙරේරා සූරියාරච්චි

මෙල්බන් සංගීත ප්‍රසංග රටාවේ නව මාවතක් විවර කරමින් රසිකයනට නොමඳ ආශ්වාදයක් ලබාදෙන අපූර්වත්වයෙන් යුත් ප්‍රසංගයක් නැරඹීමේ භාග්‍යය අපට පසුගිය දා ලැබුණා. මෙල්බන් සිඩ්නි යන නගර වලත් නවසීලන්තයේත්

යුත්තේ අපට හැකි තරම් ඉහළ මට්ටමකට යාමයි. ලාබ ලැබීමේ අරමුණෙන් බැහැර වෙලා මේ ගැන හිතන්න අපේ අනෙකුත් දර්ශණ සංවිධායකයනුත් සිතිය යුතු කාලය මේකයි කියලයි මම හිතන්නෙ.




අති සාර්ථක ලෙස පැවැත්වුණා මේ ප්‍රසංගය රූකාන්ත චන්ද්‍රලේඛා සහ ලතා වල්පොල යන ශ්‍රී ලංකා සංගීත ක්ෂේත්‍රයේ නොමැකෙන සටහන් තැබූ ගායක ගායිකාවන් විසින් පවත්වන ලද වසන්තයේ රැයක් ප්‍රසංගයයි. මේ ප්‍රසංගය පිළිබඳව අපි එහි ප්‍රධාන සංවිධායක හර්ෂ පෙරේරා සමග සංවාදයක යෙදුණා.

**ඔබ මෙවැනි දැවැන්ත ප්‍රසංගයක් සංවිධානය කිරීමට පෙළඹුණේ ඇයි?**
ඔම හිතන විදිහට ශ්‍රී ලංකාවේ සංගීත ශිල්පීන් අතර ප්‍රසාංගික බවින් ඉදිරියෙන්ම සිටින ශිල්පියා රූකාන්ත යි. ඔහු හුදෙක් ගායකයෙක් පමණක් නෙවෙයි. ඔහු සංගීත නිර්මාපකයෙක් ගීත රචකයෙක්. එයටත් වඩා වැදගත් කාරණය ඔහු සියලු ප්‍රේක්ෂකයන් ඇද බැද තබා ගැනීමේ මනා හැකියාවකින් යුත් ප්‍රසාංගික බවින් ඉහළින්ම සිටින ශිල්පියෙක් වීම. මෙවන් ශිල්පියෙක් මෙරටට ගෙන්වා අපේ රසිකයනට සුවිශේෂි අත්දැකීමක් ලබා දෙන්න මම හිතුවා. ඒ අනුවයි විශාල වෙහෙසක් දරා මේ ප්‍රසංගය සංවිදානය කළේ.

**මේ ප්‍රසංගයේ තිබූ වැදගත්ම දෙයක් තමයි ඉතාමත්ම දක්ෂ වාදකයන් රැසක් එක්ව සිටීම. ශ්‍රී ලංකාවේ සිටින අග්‍ර ගන්‍ය වාදකයන් රැසක් මේ ප්‍රසංගයට එක් කර ගන්න ඔබ හිතුවෙ ඇයි.?**
ඇත්තටම මේක රූකාන්තගේ අදහසක්. ඔහුගෙ ඉල්ලීමක්. මෙයට පෙරත් මෙරටේ බොහෝ අය රූකාන්ත මෙහි ගෙන්වා ප්‍රසංග කරන්නට උත්සාහ කළා. නමුත් රූකාන්තට අවශ්‍ය වුණේ මේ දක්ෂ වාකයන් සියලු දෙනාම සමගින් ප්‍රසංගය ඉදිරිපත් කිරීමයි. ඒ සඳහා විශාල පිරි-වැයක් දරන්නට වෙනවා. ඒ නිසා කවුරුවත් මේ කාර්යයට ඉදිරිපත් වුණේ නැහැ. නමුත් මම හිතුවා කෙසේ හෝ මේ අභියෝගය ජය ගන්න. ඒ නිසයි රූකාන්තට අවශ්‍ය වුණ සියළුම ශිල්පීන් මෙරටට ගෙන්වන්න කටයුතු කළේ. අද මම ඒ ගැන ඉතාම සතුටු වෙනවා. මොකද මේ නිසා ඉතා සාර්ථක ප්‍රසංගයක් නරඹන්න අපේ රසිකයන්ට හැකි වුණා. මගේ අදහස තමයි ඉතා අඩු මුදලට ශාලාවක් රැගෙන දෙවැනි පන්තියේ ප්‍රසංග කරනවාට වඩා අපේ ප්‍රේක්ෂකයන්ට අංග සම්පූර්ණ ශාලාවක ඉතා ඉහළ පහසුකම් යටතේ ප්‍රසංග නැරඹීමේ අවස්තාව ලබා දීම. අපි දන්නවා විදේශ වලින් එන විවිධ ගායන ශිල්පීන් මෙහි ඉතා ඉහළ මට්ටමේ ශාලා වල පවත්වන ප්‍රසංග ගැන. අයි අපි අපේ රටේ දක්ශ ශිල්පීන්ට ඒ අවස්ථාව ලබා නොදෙන්නෙ. ඇයි අපේ ගායක ගායිකාවන්ව තුන්වන ශ්‍රේණියේ ශාලා වලට ගෙනැල්ලා අඩු මට්ටමකට දාන්නෙ. අපි කළ

මෙරට පැමිණෙන ඉන්දියානු ශිල්පීන් පවා ඉතා ඉහළ මට්ටමේ ශාලා වල සිය ප්‍රසංග පවත්වද්දි අපි ඇස් කන් පියාගෙන බලා ඉන්නෙ ඇයි. අපිත් ඒ මට්ටමට යන්නටයි උත්සාහ කළ යුත්තෙ .

**ඔබ එසේ සිතීම ගැන අපි සතුටු වෙනවා. ඔබේ ඊළඟ වෑයම මොකක්ද?**
මගේ ඊළඟ වෑයම තමයි අපේ ප්‍රසංග ජාත්‍යන්තර තලයට අරගෙන යාම. එහි මූලික සැළැස්මක් හැටියට මෙල්බන් කොන්වෙන්ෂන් ශාලාවේ වැනි තැන් වල අපේ ප්‍රසංග පැවැත්වීම. එහි මූලික සැළසුම් දැනටමත් කරගෙන යනවා. ඒ අනුව රූකාන්ත ගේ මීළඟ ප්‍රසංගය මෙල්බන් කොන්වෙන්ෂන් ශාලාවේ දී පවත්වන්නට දැනටමත් සැළසුම් කරලා අවසන්. මෙයට මෙහි ප්‍රේක්ෂකයනුත් දිනා ගන්නා අටියෙන් ශ්‍රී ලංකාවට නෑකම් කියන ගයි සෙබස්තියන් වැනි ඔස්ට්‍රේලියානු රසිකයන් අතර නමක් දිනාගත් ශිල්පීනුත් සම්බන්ධ කරගන්න මම උත්සාහ කරනවා. එහි මූලික සාකච්ඡා මේ දිනවල කරගෙන යනවා.

**රූක්නාත චන්ද්‍රලේඛා ප්‍රසංගය පිලිබඳ ආපස-ˈසට හැරී බලන විට ඔබට හිතෙන්නෙ මොනවාද?**
මම ඉතාමත් සතුටු වෙනවා මෙල්බන් නගරයේ 1500 ක් පමණ පිරිසක් මේ ප්‍රසංගය නරඹන්නට පැමිණීම ගැන. ඒ එක්කම ඔවුන්ට උපරිම ප්‍රසාංගික බව ලබා දෙන්නට අපට හැකි වුණා. ඒ එක්කම මම ඒ පැමිණි සියලු දෙනාටත් අපට සහය දුන් සියලු දෙනාටත් ස්තුති කරන්න මෙය අවස්ථාව කර ගන්නවා. විශේෂයෙන් මේ සංචාරයේ දෙවන සහ තුන්වන ප්‍රසංග සිය පෞරුෂයෙන් පිරි හඬින් මෙහෙයවූ ශ්‍රීනාත් මද්දුමගේ සොහො-යුරාත් නර්තනයෙන් සහය දුන් අමා සිරිවර්ධන සොහොයුරියත් මට අමතක කරන්න බැහැ. ඒ එක්කම මේ ප්‍රසංගය සාර්ථක කරගන්නට මුළ සිටම මා සමග සිටි තිසර බණ්ඩාරටත් මගේ බිරිඳටත් නුවන් භාණුක රුක්මාල් ඇතුළු මගේ මිත්‍රයන් සියලු දෙනාටත් ස්තුති කරන්න කැමතියි. නම් වශයෙන් නොකිව්වාට අමනාප නොවනු ඇතැයි මම හිතනවා.

චාබි නුවන් ඉත්තෑපාන